# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/58 - 2018 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

4 වන සංශෝධනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව

2013 දෙසැම්බර් මස 23 දිනැති හා අංක 1842/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2015 ජූලි මස 16 දිනැති හා අංක 1923/47 දරන සහ 2016.08.11 දිනැති හා අංක 1979/33 දරන සහ 2018.08.30 දිනැති හා 2086/22 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

සී. පී. ඩබ්. ගුණතිලක,
ලේකම් (වැ.බ.).
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින.

"ආ" පරිශිෂ්ටය

***ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වැනි (III) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වන විවෘත ලිඛිත තරග විභාගයෙහි විෂය නිර්දේශය***

1. මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර පහකින් (05) සමන්විත වේ :

(i) සාමාන්‍ය බුද්ධිය ;
(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා ;
(iii) ගෝලීය ප්‍රවණතා ;
(iv) කළමනාකරණමය අභියෝග්‍යතාව ;
(v) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා.

1A - G 28525 — 10 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ආ" පරිශිෂ්ටය *(සම්බන්ධිතයි)*

2. විෂය නිර්දේශය

(i) සාමාන්‍ය බුද්ධිය :

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා :

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ සහිත බහුවරණ ප්‍රශ්න හා ව්‍යුහගත රචනා ප්‍රශ්න වලින් සමන්විත වේ.)

(iii) ගෝලීය ප්‍රවණතා :

ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව, නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව, ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්න සහ ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(iv) කළමනාකරණමය අභියෝග්‍යතාව :

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම. සන්නිවේදන කුසලතාවය, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(v) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා :

දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය රචනා/අර්ධ ව්‍යුහගත රචනා ස්වරූපයේ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

09 - 807

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.